# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# ආරක්ෂක අමාත්‍යාංශය

# ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

## නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, නේවාසික ඉංජිනේරු (03), ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක/ ජ්‍යෙෂ්ඨ කොන්ත්‍රාත් විශේෂඥ (01), ජල විද්‍යාඥ (01), ප්‍රමාණ සමීක්ෂක (03), මිනින්දෝරු (03) සඳහා පෞද්ගලික උපදේශන සේවා සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම් කැඳවීමයි.

| | | |
|---|---|---|
| **රට** | : | **ශ්‍රී ලංකාව** |
| **ව්‍යාපෘතිය** | : | **ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීම් ව්‍යාපෘතිය (RLVMMP) - අදියර II** |
| **ණය අංක / ප්‍රධාන අංක** | : | **PD 000124 - LKA** |
| **පැවරුම් ශීර්ෂය** | : | **නාවලපිටිය සිවිල් කර්මාන්ත පැකේජ 8 සහ කොළඹ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේ ඒකකය සඳහා පෞද්ගලික උපදේශකයින් බඳවා ගැනීම.** |
| **යොමු අංක** | : | **RLVMMP/ CONSUL/08-01, RLVMMP/ CONSUL/08-02, RLVMMP/ CONSUL/08-03, RLVMMP/ CONSUL/08-04, RLVMMP/ CONSUL/08-05, RLVMMP/ CONSUL/08-06** |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIB) වෙතින් ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ (RLVMMP) පිරිවැය අරභයා මූල්‍යමය පහසුකම් ලැබී ඇති අතරට එම ලැබීම් වලින් කොටසක් පෞද්ගලික උපදේශන සේවා සඳහා යොදා ගැනීම බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ආරක්ෂක අමාත්‍යාංශය විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) විෂය පථය යටතේ වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) ස්ථාපනය කොට ඇත. NBRO/PMU මගින් ක්ෂේත්‍ර විමර්ශන විස්තරාත්මක සැලසුම්, සිවිල් කර්මාන්ත ප්‍රසම්පාදනය සේවා සපයනු ලබන අතර, කොන්ත්‍රාත්හි හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ ඉංජිනේරු අංශය ලෙස කටයුතු කරනු ඇත. ව්‍යාපෘතිය, අදියර දෙකකින් ක්‍රියාත්මක කෙරෙන හඳුනාගත් නායයෑමේ අවදානම සහිත ස්ථාන / භූමි 128 කින් සමන්විතය. ව්‍යාපෘතියේ අදියර I ට ස්ථාන 28 ක්ද, අදියර II ට ඉතිරි ස්ථාන 104 ද ඇතුළත් වේ. අදියර II යටතේ ශ්‍රීලංරු. බිලියන 3.60 ක් වටිනා කොන්ත්‍රාත් උඩරට දුම්රිය මාර්ගයේ කි. මී. 225 ක දුර ප්‍රමාණයක විහිදී ඇති ව්‍යාපෘති 22 කින් සමන්විත පැකේජය 8 යටතේ ප්‍රදානය කරන ලදි. 08 පැකේජයේ බරපතල ස්වභාවය සැලකීමේදී PMU යටතේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ වරයකුගේ මූලිකත්වයෙන් කැපවූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීම කාර්ය සාධක කළමනාකරණය හා පාලනය සඳහා අවශ්‍ය වේ.

PIU ඒකකය පැකේජය 08 සඳහා භාහිරව ලබාගත් සුපරීක්ෂණ උපදේශකයකුගේ අවශ්‍යතාව වෙනුවට ඉදිකිරීම් අධීක්ෂණය පාලනය කරනු ඇත.

ආරක්ෂක අමාත්‍යාංශය (MoD) ප්‍රදානයේ ලැබීම් වලින් කොටසක් ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණ ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘතිය කාර්ය සාධනව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සුදුසුකම්ලත් පළපුරුදු පෞද්ගලික උපදේශකයින් වෙතින් උපදේශන සේවා ලබාගැනීම පිණිස යොදා ගැනීමට අදහස් කරයි.

ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් ව්‍යාපෘති උපදේශන ප්‍රසම්පාදන කමිටුවේ (CPCP) සභාපති විසින්, සුදුසුකම්ලත් පෞද්ගලික උපදේශකයින්ට, පහත සඳහන් එක් එක් උපදේශක තනතුරු යටතේ විශේෂ කොට දක්වා ඇති විෂය පරාසයකට අදාළ කර්තව්‍යයන් භාරගැනීම සාධාරණීකරණය කිරීම දැක්වෙන සවිස්තරාත්මක සංක්ෂේපයක් හා සමග පහත දැක්වෙන විශේෂිත විෂය පරාසයන් යටතේ විශේෂඥ සේවා සැපයීමට තම අභිලාෂය ඉදිරිපත් කරන ලෙස දැන් ආරාධනය කරනු ලැබේ. විස්තරාත්මක යොමු කිරීමේ අනුදේෂ හා එක් එක් තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් අවශ්‍යතාවයන් www.rlvmmp.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

අධීක්ෂණ උපදේශක (SC) තෝරා ගැනීම AIIB ප්‍රතිග්‍රාහකයින් සඳහා ප්‍රසම්පාදන උපදේශන පිළිබඳ අතුරු මෙහෙයුම් විධානයට (2016 ජූනි 2) අනුකූලව පෞද්ගලික උපදේශකයින් පිළිබඳ ජාතික තරගකාරී තෝරා ගැනීම මත පදනම්ව සිදු කෙරේ.

පෞද්ගලික උපදේශකවරුන් සුදුසුකම්, තනතුරට අදාළ පෙර පළපුරුද්ද (සහතික පිටපත්) හා පහත විශේෂ කොට දක්වා ඇති විෂය පරාසයට අදාළ සහ කාර්යය ස්වභාවයේ ප්‍රතිඵල ලබාදීම සඳහා සහයෝගී හා විශිෂ්ට අන්තර් පුද්ගල නිපුණතා මගින් ප්‍රතිඵලදායි සේවා ඉටුකිරීමට මෙම සුදුසුකම් හා පළපුරුද්ද බලපාන අන්දම සාධාරණීකරණය කිරීමට තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. එක් එක් තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් හා පළපුරුද්ද පහත දැක්වේ.

## ❖ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ

භූ විද්‍යාව පිළිබඳ සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධිය / විද්‍යාවේදී (BSc) විශේෂ උපාධිය හෝ සමාන සුදුසුකමක්

**සමග**

IESL හි ආයතනික සාමාජිකත්වය/ IGSL හි වරලත් සාමාජිකත්වය

**හෝ**

සිවිල් ඉංජිනේරු විද්‍යාව/ ව්‍යාපෘති කළමනාකරණය/ ව්‍යුහාත්මක සැලසුම්/ ඉදිකිරීම් කළමනාකරණය/ භූතාක්ෂණික ඉංජිනේරු විද්‍යාව/ ඉංජිනේරුමය භූ විද්‍යාව පිළිබඳ මාස්ටර්ස් උපාධිය

**සහ**

ඉදිකිරීම් කළමනාකරණය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ වසර 10 ක පළපුරුද්ද සහ බෑවුම් ස්ථායිකරණය ඇතුළු වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය සහ / හෝ වැඩි දියුණු කිරීම ආදිය සම්බන්ධ සමාන තනතුරක හා සමාන ව්‍යාපෘතියක අඩු තරමින් වසර 05 ක පළපුරුද්ද ඇතුලුව ඉදිකිරීම් කර්මාන්තයේ අවම වශයෙන් වසර 15 ක අදාළ පළපුරුද්ද.

බහු ආංශික, ආධාරක අරමුදල් ලබන ප්‍රවේශයන් යටතේ අඩු තරමින් ව්‍යාපෘති දෙකක (02) පළපුරුද්ද.

## ❖ නේවාසික ඉංජිනේරු - තනතුරු 03

සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ප්‍රථම උපාධිය හෝ සමාන සුදුසුකමක් සමග IESL හි ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන සුදුසුකම් වේ.

**සහ**

භූ තාක්ෂණික ඉංජිනේරු විද්‍යාව, ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යුහාත්මක සැලසුම්, ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ මාස්ටර්ස් උපාධිය.

**හෝ**

IESL හි ආයතනික සාමාජිකත්වය වඩාත් මැනවි. සමාන තනතුරක ඉදිකිරීම් අධීක්ෂණය සහ ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ වසර 05 පළපුරුද්ද ඇතුලුව ඉදිකිරීම් කර්මාන්තයේ අවම වශයෙන් වරස 15 ක පළපුරුද්ද අවශ්‍ය වේ. බෑවුම් ස්ථායිකරණය/ නිවැරදි කිරීම පිළිබඳ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද අත්‍යවශ්‍යය.

බහු ආංශික ආධාර මගින් අරමුදල් සැපයෙන ව්‍යාපෘති අඩු තරමින් එකක (01) හෝ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

## ❖ ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක/ ජ්‍යෙෂ්ඨ කොන්ත්‍රාත් විශේෂඥ - තනතුරු 01

ප්‍රමාණ සමීක්ෂණය හෝ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකම්.

**සමග**

වෘත්තීය සුදුසුකම් (ආයතනික/ වරලත්)

**හෝ**

ව්‍යාපෘති කළමනාකරණය/ ඉදිකිරීම් නීතිය හා ආරවුල් බේරුම් කිරීම් පිළිබඳ මාස්ටර්ස් උපාධිය, සිවිල් ඉංජිනේරු ව්‍යාපෘතීන් හි ඉදිකිරීම් කොන්ත්‍රාත් කළමනාකරණය, කොන්ත්‍රාත් පරිපාලනය, පිරිවැය පාලනය, ඉල්ලීම් කළමනාකරණය සහ ආරවුල් බේරුම් කිරීම පිළිබඳ අඩු තරමින් වසර 8 ක පළපුරුද්ද සහ ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක/ ජ්‍යෙෂ්ඨ කොන්ත්‍රාත් විශේෂඥ ලෙස බහු ආංශික ආධාර මගින් අරමුදල් සැපයන ව්‍යාපෘතීන් අඩු තරමින් දෙකක (02) හෝ වසර 5 ක පළපුරුද්ද සහිතව ඉදිකිරීම් කර්මාන්තයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද අයදුම්කරු ලබා තිබීම අත්‍යවශ්‍ය වේ.

## ❖ ජල විද්‍යාඥ - තනතුරු 01

ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සමග ජලවිද්‍යාව/ ජල ශක්ති විද්‍යාව/ ජල සම්පත් ඉංජිනේරු ක්ෂේත්‍රය පිළිබඳ මාස්ටර්ස් උපාධිය සමග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්.

විශේෂඥහට සිවිල් ඉදිකිරීම් කර්මාන්තයේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද

**සමග**

නායයාම්වලට නැඹුරු හෝ ආපදා අවදානම් ප්‍රදේශ බෑවුම් ස්ථායිකරණය, ජලාපවහන සැලසුම් සහ ගං වතුර අවදානම් ස්ථාවර කිරීම් අවනත ව්‍යාපෘති (වඩාත් මැනවි) වන ජල විද්‍යාත්මක තක්සේරු කිරීම්, මෝස්තර නිරූපණය සහ ජල කළමනාකරණය පිළිබඳ අඩු තරමින් වසර 05 ක පළපුරුද්ද විශේෂඥ සතු විය යුතුය.

ජල විද්‍යාත්මක පද්ධතීන් කෙරෙහි දේශගුණික විපර්යාසයන්හි සංඝට්ටනය සහ නායයාම් අවදානම් වඩාත් කුපිත කරවීමෙහි ලා ඒවාහි භූමිකාව සහ ජලාපවහන හා ජල පාලන පද්ධතීන් පිළිබඳ නිපුණතාවය සහිත විය යුතුය. බහු ආංශික සංවර්ධන නියෝජිතායතන මගින් අරමුදල් සැපයෙන ව්‍යාපෘතීන්හි වැඩ කිරීමේ පළපුරුද්ද වඩාත් සුදුසු වේ.

## ❖ ප්‍රමාණ සමීක්ෂක - තනතුරු 03

ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකමක්

**සමග**

උපදේශන සේවාවන් ඇතුළත ප්‍රධාන ව්‍යාපෘතියක ප්‍රමාණ සමීක්ෂකයකු ලෙස අවම වශයෙන් වසර 03 ක් ඇතුලුව සිවිල් ඉදිකිරීම් කර්මාන්තයේ අඩු තරමින් වසර 6 ක පළපුරුද්ද.

## ❖ මිනින්දෝරු - තනතුරු 03

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මැනීම පිළිබඳ ප්‍රථම උපාධිය හෝ සමාන සුදුසුකම් සහිත බලපත්‍රලාභී මිනින්දෝරුවකු වීම.

**සහ**

මිනින්දෝරුවකු ලෙස සිවිල් ඉදිකිරීම් කර්මාන්තයන්ට අදාළ අඩු තරමින් වසර 03 ක පළපුරුද්ද ඇතුලුව අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

### වැඩ පිහිටි ස්ථාන

| උපදේශක | PMU කාර්යාලය කොළඹ | නාවලපිටිය DPD කාර්යාලය | බණ්ඩාරවෙල නේවාසික ඉංජිනේරු කාර්යාලය | සම්පූර්ණ තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | - | තනතුරු - 01 | - | තනතුරු - 01 |
| නේවාසික ඉංජිනේරු | - | තනතුරු - 01 | තනතුරු - 02 | තනතුරු - 03 |
| ජ්‍යෙෂ්ඨ කොන්ත්‍රාත් විශේෂඥ ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සමීක්ෂක | - | තනතුරු - 01 | - | තනතුරු - 01 |
| ජල විද්‍යාඥ | තනතුරු - 01 | - | - | තනතුරු - 01 |
| ප්‍රමාණ සමීක්ෂණ | තනතුරු - 01 | තනතුරු - 01 | තනතුරු - 01 | තනතුරු - 03 |
| මිනින්දෝරු | - | තනතුරු - 01 | තනතුරු - 02 | තනතුරු - 03 |

### තෝරා ගැනීම

තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ, සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම් වන අතර, කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සුදුසුකම්, අදාළ විෂය පරායන් යටතේ ව්‍යාපෘතීන්හි වැඩ කිරීමෙන් ලබා ඇති පළපුරුද්ද හා අදාළ පරාසයන්හි විශේෂඥ සේවා සැපයීමේ පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කිරීම් සිදු කෙරෙනු ඇත.

**ගෙවීම් සාකච්ඡා කොට තීරණය කළ හැකිය.**

**සංක්ෂේපය හා අදාළ විස්තර ඉදිරිපත් කිරීම.**

ඔබේ අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද සහිත සම්පූර්ණ ජීවදත්ත සමග උපදේශනයෙහිලා ඔබගේ අභිලාෂය විද්‍යා දක්වන ආවරණ ලිපිය බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන උපදේශන තනතුර සඳහන් කොට 2025 ජනවාරි 27 දින හෝ ඊට පෙර කොළඹ, ජාවත්ත පාර, 99/1, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO), ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ (RLVMMP) ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත තැපැල් මගින් එවිය යුතුය/ ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් pd.piu8rlivmmp@gmail.com වෙත ඊමේල් කළ යුතුය.

**සභාපති,**
**ව්‍යාපෘති උපදේශන ප්‍රසම්පාදන කමිටුව, (CPCP)**